**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**පළමු වාර පරීක්ෂණය 2018**

| | | |
|---|---|---|
| **6 ශ්‍රේණිය** | **පුරවැසි අධ්‍යාපනය** | **කාලය**<br>**පැය 02යි.** |

**නම:-** ..........................................................................................................................

## I කොටස

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1. තම ඉලක්ක ජය ගැනීම සඳහා තමන් තුළ වර්ධනය කර ගත යුතු ගුණාංගයක් නොවේ.
   - i. ආත්ම විශ්වාසය
   - ii. චිත්ත ධෛර්යය
   - iii. උදාසීන බව
   - iv. කැපවීම

2. සැලසුම් සහගත වූ ශිෂ්‍යයා
   - i. අත්‍යවශ්‍ය පියවර අත්හරියි.
   - ii. වැඩ කල් දමයි.
   - iii. ආතතියෙන් තොර වෙයි.
   - iv. අභියෝගවලට අපහසුවෙන් මුහුණ දෙයි.

3. පාසල මගින් අවට ප්‍රජාවට ලබාදෙන පණිවිඩයක් නොවේ.
   - i. දරුවන් පාසල් යැවීමේ වැදගත්කම
   - ii. නිසි පෝෂණය ලැබීමේ වැදගත්කම
   - iii. පරිසරය විනාශ කිරීමේ වැදගත්කම
   - iv. යහපත් සෞඛ්‍ය පුරුදුවල වැදගත්කම

4. ඔබ සතු යුතුකමක් වන්නේ

   i. තම අදහස ඉදිරිපත් කිරීම.
   ii. අධ්‍යාපනය ලැබීම.
   iii. හැකියා දියුණු කර ගැනීම.
   iv. අන් අයට ගරු කිරීම.

5. ගුරු මණ්ඩලය වෙනුවෙන් ඔබෙන් ඉටු විය යුතු යුතුකම් අතර අයත් නොවේ.

   i. ආචාරශීලී වීම.
   ii. ගරු කිරීම හා කීකරු වීම.
   iii. ආත්මාර්ථකාමී වීම.
   iv. අවවාද අනුශාසනා පිළිගෙන කටයුතු කිරීම.

- **ප්‍රශ්න අංක 6-10 දක්වා හිස්තැන් පුරවන්න. (සැලසුම්කරණය , පාසල් ඉතිහාසය , විදුහල්පති , පාසල් සංවර්ධන ව්‍යූහය , සේනක බිබිලේ මහතා )**

6. ........................................ යනු පාසල ආරම්භ වූ දා සිට වර්තමානය දක්වා විකාශනය වූ ආකාරය පිළිබඳ තොරතුරු වේ.
7. පාසලේ පරිපාලන කටයුතු හා සංවර්ධන කටයුතු සංවිධානය වී ඇති ආකාරය ........................................ වේ.
8. පාසලේ පාලනයට සම්බන්ධ ප්‍රධාන තනතුරක් වන්නේ ........................................ ය.
9. රාජ්‍ය ඔසුසල නිර්මාතෘ මෙන් ම ඖෂධවේදය පිළිබඳ මෙරට ප්‍රථම මහාචාර්යවරයා වන්නේ ........................................ යි.
10. යම් කාර්යයක් වඩා ඵලදායි ලෙස ඉටු කිරීම සඳහා කාර්ය කොටස් අනුපිළිවෙළකට කාල රාමුවක් ඇතුළත ක්‍රියාත්මක කිරීම ........................................ යි.

- **ප්‍රශ්න අංක 11-15 දක්වා ඇති වගන්ති හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද වරහන තුළ යොදන්න.**

11. අධ්‍යාපන කටයුතුවල නියමුවා ලෙස ක්‍රියා කිරීම විදුහල්පතිතුමාගේ කාර්යභාරයක් නොවේ. (......................)
12. පාසල් සංවිධාන ව්‍යූහයක් තුළ දක ගත හැකි වෙනත් කමිටුවක් ලෙස පාසල් කළමනාකරණ කමිටුව දැක්විය හැක. (......................)
13. සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමා 1931 වර්ෂයේ දී ලංකා ජාතික සංගමයේ සභාපතිත්වය දරා ඇත. (......................)

14. පාසලේ පවත්නා නීතිරීති, සම්ප්‍රදායන් හා සිරිත් විරිත් පමණක් පාසල් සංස්කෘතියට අයත් වේ. (.........................)

15. පාසල් සමාජයේ සාමාජිකයෙකු ලෙස ඔබ හට සමාන ලෙස සැලකුම් ලැබීමට අයිතියක් ඇත. (.........................)

- **ප්‍රශ්න අංක 16-20 වඩාත් සුදුසු පිළිතුර යා කරන්න.**

16. පාසලේ ඉතිහාසය පිළිබඳ තොරතුරු ලබා ගත හැකි ප්‍රධාන මූලාශ්‍රයකි.
17. පාසලේ සංවිධාන ව්‍යූහයේ එක් භූමිකාවකි
18. සීඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමා ශ්‍රී ලංකාවේ මුල් ම අධ්‍යාපන ඇමතිවරයා ලෙස පත් වූ වර්ෂය
19. පාසලක් ක්‍රමවත් ව විධිමත් ව හා විනයගරුක ව පවත්වා ගැනීම සඳහා වැදගත් වනුයේ
20. ඔබගේ ඇතුළත්වීමේ අංකයේ නිවැරදි බව තහවුරු කර ගත හැකි ආකාරයක් වන්නේ

| |
|---|
| සිසුන් ඇතුළත් කිරීමේ ලේඛනය |
| ශිෂ්‍යයා |
| ආදි ශිෂ්‍ය සංගමය |
| 1931 |
| ලොග් සටහන් පොත |
| පාසල් සංවිධාන ව්‍යූහය |
| 1920 |
| පාසල් නීති පද්ධතිය |

## II කොටස

- **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

1. i. ඔබේ පාසල ආරම්භ කිරීමට හේතුව, ආරම්භ කළ දිනය හා ආරම්භ කිරීමට මූලික වූ පුද්ගලයෙකු යනාදිය ලියා දක්වන්න. (ල.3)

   ii. ඔබේ පාසලේ ආදර්ශ පාඨය හා එහි අර්ථය සඳහන් කරන්න. (ල.4)

   iii. පාසලේ ඉතිහාසය පිළිබඳ තොරතුරු සොයා ගැනීමට උපකාරී වන මූලාශ්‍ර 5ක් ලියන්න. (ල.5

2. i. පාසලකට සංවිධාන ව්‍යූහයක් අවශ්‍ය වන්නේ ඇයිදැයි කරුණු දෙකකින් සඳහන් කරන්න. (ල.3)

   ii. ඔබ පාසලේ සංවිධාන ව්‍යූහය තුළ ක්‍රියාත්මක වන කමිටු 4ක් සඳහන් කර ඒවායින් ඉටු වන කාර්යයන් එක බැගින් ලියන්න. (ල.4)

   iii. පාසලේ සාමාජිකයෙකු ලෙස ශිෂ්‍යය/ ශිෂ්‍යාවකගේ යුතුකම් / වගකීම් 5ක් ලියන්න. (ල.5)

3. i. ඔබ සතු දක්ෂතා 2ක් හා දුර්වලතාවයක් සඳහන් කරන්න. (ල.3)

ii. ඔබ සතු දක්ෂතා වැඩිදියුණු කිරීමට ඔබ විසින් අනුගමනය කළ යුතු දෑ කරුණු 4කින් ලියා දක්වන්න. (ල.4)

iii. තම දුර්වලතා අවම කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග 5ක් ලියන්න. (ල.5)

4. i. සැලසුම් සහගත ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක තුළ වන ලක්ෂණ 3ක් ලියන්න. (ල.3)

ii. ඔබගේ පන්ති කාමරය පවිත්‍ර ව හා පිළිවෙළට තබා ගැනීම සඳහා සැලසුමක් සකස් කිරීමේ දී සැලකිළිමත්විය යුතු කරුණු 4ක් ලියා දක්වන්න. (ල.4)

iii. සැලසුම්කරණය හා සංවිධානය නිසා අත් වන වාසි 5ක් ලියන්න. (ල.5)

5. i. '' සම්ප්‍රදායන්' '' හඳුන්වන්න. (ල.3)

ii. පාසලට නීති පද්ධතියක් අවශ්‍ය වීමට හේතු 4ක් ලියන්න. (ල.4)

iii. ඔබ පාසලේ අනන්‍යතාව පිළිබිඹු කරන සංකේත 5ක් නම් කරන්න. (ල.5)

6. i. ඔබ පාසලේ දැක්ම හා මෙහෙවර ප්‍රකාශය වෙන වෙන ම ලියන්න. (ල.3)

ii. පාසල් සාමාජිකයෙකු ලෙස ඔබ සතු අයිතිවාසිකම් 4ක් ලියන්න. (ල.4)

iii. පාසල් කොඩිය ඔසවන අවස්ථාවක දී ප්‍රදර්ශනය කළ යුතු ඉරියව් 3ක් හා පාසල් කොඩිය ඔසවන අවස්ථා 2ක් ලියා දක්වන්න. (ල.5)

7. i. ළමා මිතුරු පාසලක් යනු කුමක් ද? (ල.3)

ii. ළමා මිතුරු පාසල් පරිසරයක හඳුනා ගත හැකි ලක්ෂණ 4ක් ලියන්න. (ල.4)

iii. ඔබ පාසලෙන් සමාජයට සැපයෙන සේවාවන් 5ක් ලියන්න. (ල.5)